රුහුණ විශ්වවිද්‍යාලය

2015/2016 ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි - 2000 ස්ථලය
දෙවන සමාසික පරීක්ෂණය - 2017 මාර්තු

**ACL 22633** - ඉන්දියාවේ පැරණි කලා ශිල්ප සහ වාස්තුවිද්‍යාව

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු විය හැකිය.

කාලය : පැය 03

---

01. ප්‍රාග් මානව සමාජයන්හි හැසිරීම් රටාව හඳුනා ගැනීමට ගිරි චිත්‍රවලින් (Rock Art) ලැබෙන දායකත්වය පැහැදිලි කරන්න.

02. ක්‍රි.පූ. 3000ත් ක්‍රි.පූ. 1500ත් අතර ඉන්දියාවේ බිහිව තිබූ නාගරික ශිෂ්ටාචාරයේ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳ ප්‍රමාණවත් විස්තරයක් සපයන්න.

03. පුරාණ ඉන්දියාවේ ස්තූප සංකල්පයේ ආරම්භය පිළිබඳව ඇති සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක සාධක ගෙනහැර දක්වමින් ස්තූපය සංවර්ධිත අවස්ථාවට පත්වීම දක්වා වූ ගමන් මග පැහැදිලි කරන්න.

04. මෞර්ය යුගයේ වර්ධනය වූ බෞද්ධ විස්තුවිද්‍යාව සහ කලාව සුංග ආන්ද්‍ර යුගය තුළ සංවර්ධනය වූ ආකාරය උදාහරණ සපයමින් පෙන්වා දෙන්න.

05. ගුප්ත යුගයේ ඉදි කළ ගොඩනැගිලිවල මූලික සැලසුම්වල ස්වභාවය කවරාකාර දැයි හඳුන්වා දී පසු කාලයක ඒවා විවිධ ඉසව් ඔස්සේ විකාශනය වී ගිය ආකාරය පැහැදිලි කරන්න.

06. පර්වත හාරා ලෙන් තැනීමේ කර්මාන්තයේ ආරම්භය සහ විකාශය පැහැදිලි කර සංඝාරාමවල අභ්‍යන්තර සැලසුම්කරණය අජන්තා ලෙන් විහාර ඇසුරින් පෙන්වා දෙන්න.

07. පහ්ලව ගෘහනිර්මාණ සම්ප්‍රදායේ දක්නට ඇති ප්‍රධාන ලක්ෂණ උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

08. පහත මාතෘකා අතරින් දෙකකට (02) ප්‍රමාණවත් සටහන් ලියන්න.
   i. පූර්ව හරප්පා යුගයේ වාස්තු විද්‍යාව
   ii. ඉන්දු නිම්නයෙන් හමුවන කලා කෘති
   iii. මෞර්ය යුගයේ වාස්තුවිද්‍යාව
   iv. පිහිටි ගලේ නෙලූ චෛත්‍යශාලා

@@@@@@@@@

37